# සය මාසික අධ්‍යාපන ක්‍රමයේ යෝග්‍යයතාවය
## (කැලණිය විශ්වවිද්‍යාලය ඇසුරින් කරන ලද පර්යේෂණයකි)

එම්.ඒ. රුෂාන්ති දිල්ෂානි[1]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතියෙහි අධ්‍යාපනික රටාව ශිෂ්‍ය ප්‍රජාවට බලපාන අන්දම සහ එහි ඵලදායිතාව පිළිබඳ මෙම පර්යේෂණය මඟින් විමර්ශනය කර ඇත. මෙම පරීක්ෂණයේ අධ්‍යයන ගැටලුවන්නේ සය මාසික අධ්‍යාපන රටාව යනු කුමක්ද? එය විද්‍යාර්ථීන්ට සිදුකරන බලපෑම කෙබඳුද? යන්නයි. ඵලදායිතාව සහ සය මාසික අධ්‍යාපන රටාවේ යෝග්‍යභාවය කෙරෙහි බලපාන සාධක හඳුනාගැනීම අධ්‍යයන අරමුණවේ. අධ්‍යයනය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ සියලුම විද්‍යාර්ථීන් නියෝජනය වන පරිදි නියැදි ඒකක 100කින් සමන්විතවන සසම්භාවී නියැදියක් යොදාගන්නා ලද අතර ප්‍රශ්නාවලි හා සම්මුඛ සාකච්ඡා මඟින් ද ප්‍රාථමික දත්ත ලබාගන්නා ලදී. සය මාසික අධ්‍යාපන ක්‍රමය ශිෂ්‍ය ප්‍රජාව අතර වඩාත් පිළිගත් ක්‍රමයක් වුවත් එය න්‍යායාත්මක වශයෙන් ප්‍රායෝගික නොවන්නක් බව අධ්‍යයනය මඟින් තහවුරුවිය. එසේම විශ්වවිද්‍යාලයට පැමිණීමත් සමඟ විද්‍යාර්ථීන් විෂයයන් තෝරාගැනීම සම්බන්ධ විමසීමේදී බහුතරයක් වෘත්තියාභිමුඛව විෂයයන් තෝරාගැනීමට නැඹුරුවක් දක්වන බවත්, ඔවුන් විශේෂයෙන්ම සය මාසික ක්‍රමයට දැඩි රුචියක් දක්වන බවත් පැහැදිලි විය. නමුත් එම ක්‍රමය විද්‍යාර්ථීන්ගේ දැනුම ගවේෂණය උදෙසා යෝග්‍ය නොවන්නක් බව පැහැදිලි විය. විද්‍යාර්ථීන් දැනුමින් කෙතරම් දුරට ස්වයංපෝෂිතද යන්න විමසා බැලීමේදී බහුතරයක් සිසුන් සිය අධ්‍යයන කාල සීමාව හෙවත් අදාල අර්ධ වාර්ෂිකය තුළ පමණක් ඉගැන්වෙන විෂය කරුණු සම්බන්ධව දැනුමින් යුක්ත වුවද පසුගිය අර්ධ වාර්ෂිකයන්හි අධ්‍යයනය කරන ලද විෂය කරුණු සම්බන්ධව දැක්වූයේ ඍණ ආකල්පයකි. බහුතරයක් එය අවසාන පරීක්ෂණය අරමුණු කරගෙන හැදෑරුවක් පමණක් බවත් දැනුම ගවේෂණය ඔවුන්ගේ පරමාර්ථය නොවන බවත් යොමුකරන ලද ප්‍රශ්නාවලිවලට සපයන ලද පිළිතුරු වලින් හෙළි විය. තවද සංඛ්‍යාත්මක නිගමනයන් තහවුරු කළ හැකි වන පරිදි විද්‍යාර්ථීයින්ගේ විෂයානුබද්ධ දැනුම සම්බන්ධව එක් එක් පීඨයන්ට අදාලව යොමු කරන ලද ප්‍රශ්නාවලීන්ට ලද පිළිතුරු අනුව සිසුන්ගේ දැනුම ඍණ මට්ටමක පවතින බව තහවුරු විය. පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් යොදා ගන්නා ලද ප්‍රශ්නාවලි ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමය මගින් වඩාත් සාර්ථක දත්ත ලබාගැනීමේ හැකියාවක් ලැබුණු අතර පර්යේෂණයේ අවසන් නිගමන ලබා ගැනීමටද එම ක්‍රමයන් වඩාත් යෝග්‍ය විය. ඒ අනුව සය මාසික අධ්‍යාපන ක්‍රමය ශිෂ්‍ය ප්‍රජාවගේ පක්ෂයෙන් ගත් කල සාර්ථක අධ්‍යයන

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය
rushanthidilshani@gmail.com

රටාවක් බව පෙනුනද න්‍යායාත්මක වශයෙන් ගත් කල මෙම අධ්‍යයන රටාවේ යෝග්‍යතාව පිළිබඳ ගැටලු මතුවන බව පර්යේෂණය තුළින් පැහැදිලි වේ.

**මුඛ්‍ය පද :** *විද්‍යාර්ථියා, පර්යේෂණය, සය මාසික, අධ්‍යයන ක්‍රමය*